# නිවේදනය

# උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත 2 සේවා ගණයේ සමාජ සේවා නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2026

උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත 2 සේවා ගණයේ සමාජ සේවා නිලධාරී II ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමට උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2026.08.07. දිනට පෙර අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව - 03

**1. මූලික සුදුසුකම්**

අයදුම්පත් කැඳවන අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**1.1. අධ්‍යාපන සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යා විෂය සහිතව උපාධියක් ලබා තිබීම.

**1.2. වෘත්තීය සුදුසුකම්**

කාර්ය සාධනය අවම වශයෙන් සතුටුදායක මට්ටමේ තිබීම සහ උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ තනතුරේ ස්ථිර කර තිබීම.

**1.3. කායික සුදුසුකම්**

සෑම අයදුම්කරුවෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**1.4. වයස් සීමාව**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු වේ.

**2. බඳවා ගැනීමේ ක්‍රමය**

I. මෙම විභාගය පහත දැක්වෙන විෂයයන් දෙකකින් යුක්ත වන අතර, එම විෂයන් දෙකෙන්ම සමත් අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කර බලා බඳවාගනු ලැබේ.

II. මෙම විභාගය පහත විෂයන්ට අදාළව ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම | විෂය ක්ෂේත්‍රයට අදාළව සමාජ සේවා හා සමාජ සුභ සාධන කටයුතු පිළිබඳ ප්‍රශ්න ඇතුළත් වේ. | පැය 02 |
| 2. අභියෝග්‍යතාවය | භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය, තර්කන ශක්තිය මැන බැලෙන කෙටි හා බහුවරණ ප්‍රශ්න වලින් යුක්ත වේ. | පැය 01 |

එක් එක් විෂය සමත්වීමට අවම වශයෙන් 40% ලකුණු ප්‍රතිශතයක් ලබා ගත යුතුය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
ii. පත්වීම් ලද නිලධාරීන් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**4. තනතුරට අදාළ වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව (MN5 – 2025)
රු.58,660-10 X1,190-11X1,360-15X1,670-110,570ක වැටුප් පරිමාණයක් හිමි වේ.
මීට අමතරව රජය විසින් අනුමත අනෙකුත් දීමනා හිමිය.

**5. විභාග මධ්‍යස්ථානය :-** මෙම විභාගය අනුරාධපුර නගරයේදී පැවැත්වේ.

**6. අයදුම් කළ යුතු පිළිවෙල :-**

i. මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව A 4 ප්‍රමාණයේ (සෙ.මී 21x25) කඩදාසියක දෙපැත්තම භාවිතයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අයදුම්පත් පිළියෙළ කරන විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම යෙදීම අත්‍යාවශ්‍යය.

අයදුම්පත්‍රයේ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවටද 05 සිට 10 තෙක් දෙවන පිටුවටද ඉතිරිය තුන්වන පිටුවටද වන ලෙස ගෙන අයදුම්පත්‍රය සකස් කරගත යුතු අතර, ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. තම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**ii. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කිරීම අනිවාර්ය වන අතර ආයතන ප්‍රධානියා විසින් අයදුම්කරුවන්ගේ අත්සන සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබුණු අයදුම්පත් ඔවුන්ගේ නිර්දේශ සහිතව පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කිරීමෙන් අනතුරුව ඔවුන් විසින් නිර්දේශ කරන ලද අයදුම්පත් 2026.08.07 දින හෝ එදිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

**7. විභාගය පවත්වන භාෂා මාධ්‍යය :-** මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් පවත්වනු ලැබේ. ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ අයදුම්කරුවන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

**8. අයදුම්පත් භාර ගැනීම :-** නියමිත ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ, නියමිත විභාග ගාස්තු නොගෙවූ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන හා ප්‍රමාදවන අයදුම්පත් පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලකට වග කියනු නොලැබේ.

**9.** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගය සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුරට තෝරාගත් බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**10.** විභාග ගාස්තු :-

සෑම අයදුම්කරුවෙකුම රු.720/- ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව උතුරු මැද පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවීම් කර ඒ සඳහා නිකුත් කරන එන්සී 100 කුවිතාන්සිය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

**12. විභාගයට පෙනී සිටීම :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අයදුම්කරුවන්වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පවත්වන දිනට ප්‍රථම තම ප්‍රවේශ පත්‍ර නොලැබුණ අපේක්ෂකයින් වෙතොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඒ පිළබඳ විමසිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී, පෙනී සිටින සෑම විෂයක් පාසාම, විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු අතර , ඒ සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියලුම නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**13. සාවද්‍ය තොරතුරු සැපයීම :-** මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අයදුම්කරුවෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. යම් හෙයකින් තෝරා පත්කර ගැනීමෙන් පසු කුමන හෝ අවස්ථාවක කිසියම් තොරතුරක් සාවද්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබේ.

**14.** මෙම විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය මෙම කොමිෂන් සභාව සතු වේ.

මෙම නිවේදනයේ ඇතුළත් නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමද පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණයගැනීමද මෙම කොමිෂන් සභාව සතු වන්නේය.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2026.07.17